## සාමාන්‍ය සමයේ විසිසත්වන සතිය
## බදාදා

## පළමුවන කියැවීම

ජෝනා දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

ජෝනා 4 : 1 - 11

"මා නිනීවයේ නගරයට කුමක් සිදුවේද කියා බැලිය යුතු නොවේ ද?"

දෙවියන් වහන්සේ නිනීවයට කරන්නට අදහස් කළ විපත නොකළ බැවින් ජෝනා ඊට අතිශයින් අප්‍රසන්න ව කෝප විය. ඔහු සමිඳාණන් වහන්සේට මෙසේ යාච්ඤා කළේය. "අහෝ සමිඳුනි, මා කීවේ මෙයම නොවේ ද ? තර්ෂිෂ්ට පලා යන්නට මා ඉක්මන් වූයේ එබැවිනි. මන්ද, ඔබ දයාවන්ත, අනුකම්පා සහගත, වහා නොකිපෙන සුලු, ඉතා කරුණාවන්ත, විපත්ති පැමිණවීමට නොකැමති දෙවි කෙනෙකු බව මම දැනගෙන සිටියෙමි. ඉතින් සමිඳුනි, මාගේ ප්‍රාණය මාගෙන් තුරන් කළ මැනව. ජීවිතයට වඩා මරණය මට හොඳ ය."

සමිඳාණන් වහන්සේ ජෝනා අමතා, "කෝප වීමට නුඹට යුතු දැ"යි ඇසූ සේක.

එවිට ජෝනා නගරයෙන් පිටතට ගොස් නගරයට නැගෙනහිරින් හිඳ ගත්තේය. ඔහු එහි පැලක් සාදාගෙන නගරයට කුමක් සිදුවේද කියා බලන පිණිස එහි සෙවණ යට හිඳ ගත්තේය. දෙවි සමිඳාණන් වහන්සේ ජෝනා ඔහුගේ දුකින් මුදන පිණිස ලබු වැලක් වැඩෙන්නට නියම කර, ඔහුගේ හිසට උඩින් එය සෙවණක් සේ යන්නට සැලසූ සේක. ජෝනා ලබු වැල ගැන ඉතා ප්‍රීති විය.

එහෙත් පසුදා පහන් වූ විට ලබු වැල කන පිණිස පණුවෙකු ඇති වන්නට දෙවියන් වහන්සේ සැලැසූ සේක. ඌ ලබු වැල කෑ විට එය වියළී ගියේය. තවද, ඉර උදා වූ කල, ඉතා උෂ්ණ සුළඟක් පෙරදිගින් හමන්නට උන් වහන්සේ නියම කළ සේක. අවු රශ්මිය ජෝනාගේ හිසට වැදී ඔහු ක්ලාන්ත වී, "ජීවිතයට වඩා මරණය හොඳ ය" කියා සිය ප්‍රාණය හානි කරන ලෙස යාච්ඤා කළේය.

එවිට දෙවියන් වහන්සේ "ලබු වැල ගැන කෝප වීම නුඹට යුතු දැ"යි ජෝනාගෙන් ඇසූ සේක. "මැරෙන තරම් කෝප වීම මට යුතු ය"යි ඔහු කීවේය.

එවිට සමිඳාණන් වහන්සේ ජෝනා අමතා, "නුඹේ ශ්‍රමය වත්, වගාව වත් නැතිව එක රැයකින් ඇති වී, එක රැයකින් නැති වී ගිය ලබු වැල ගැන නුඹ අනුකම්පා කළෙහි නම්, තමන්ගේ දකුණතත් වමතත් අතරේ වෙනස නොදන්න එක් ලක්ෂ විසි දහසකට වඩා මනුෂ්‍යයන් ද ගවයන් ද සිටින නිනිවය නම් ඒ ශ්‍රේෂ්ඨ නගරය කෙරෙහි මාත් අනුකම්පා කළයුතු නොවේ දැ"යි වදාළ සේක.

දේව වචනය මෙසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 85: 3-6, 9-10

පිළිතුර: මාගේ සමිඳුනි, ඔබ දයානුකම්පාවේ දෙවිඳාණෝ ය.

ගීය:

මාගේ සමිඳුනි, මට අනුකම්පා කළ මැනව.
මුළු දවස පුරා මම ඔබට අයදිමි.
ඔබේ දාසයාගේ සිත ප්‍රීතිමත් කළ මැනව. මන්ද, මාගේ සමිඳුනි,
මම ඔබට යාච්ඤා කරමි.

මාගේ සමිඳුනි, ඔබ යහපත් ය. ඔබ කමා කරන සේක.
ඔබට අයදින සියල්ලන්ට තිර පෙම බහුලව ප්‍රදානය කරන සේක.
සමිඳුනි, මාගේ අයැදුමට සවන් දුන මැනව. පිහිට පතමින් මා කරන
අයැදුමට කන් දුන මැනව.

මාගේ සමිඳුනි, ඔබ මැවූ සියලු ජාතීහු ඔබ වෙත පැමිණ ඔබට
නමදින්නෝ ය. ඔව්හු ඔබේ නාමය පසසමින් ඔබට ගරු කරන්නෝ
ය. ඔබ බලසම්පන්න ය. අරුම පුදුම දේ කරන සේක.
ඔබ පමණක් දෙවිඳාණෝ ය.

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
සමිඳුනි, ඔබේ ව්‍යවස්ථාව රක්ෂා කිරීමට අපට මනා අවබෝධය දුන මැනව.
මුළු සිතින් එය අපි පිළිපදින්නෙමු.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
"අබ්බා පියාණෙනි" යි දෙවි සමිඳුන් අමතා යාච්ඤා කිරීමට ඉඩ ඇති පුත්‍රකම ලැබීමේ තත්ත්වයක් ඔබ ලබා ඇත්තේය.
ආලේලූයා!

## සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 11: 1-4

"ස්වාමිනී, යාච්ඤා කරන්නට අපටත් ඉගැන්නුව මැනව.?"

ජේසුස් ස්වාමින් වහන්සේ එක් තැනක යාච්ඤා කරමින් සිටි සේක. එය නිම වූ පසු උන්වහන්සේගේ ශ්‍රාවකයන්ගෙන් එක් තැනැත්තෙක් කතා කොට "ස්වාමිනී, ජුවාම් තම ගෝලයන්ට ඉගැන්වූ ලෙස අපටත් යාච්ඤා කරන්නට ඉගැන්නුව මැනවැ"යි කීවේය. උන්වහන්සේ ඔවුනට මෙසේ වදාළ සේක. "ඔබ යාච්ඤා කරන කල මෙසේ කියන්න.

පියාණෙනි, ඔබගේ නාමයට ගෞරව වේවා!

ඔබගේ රාජ්‍යය පැමිණේවා!

අපේ දිනපතා භෝජනය දිනෙන් දින අපට දුන මැනව.

අපේ පව් අපට කමා කළ මැනව.

මන්ද, අපට ණයගැතිව සිටින හැමට අප කමා වන බැවිනි. අප පරීක්ෂාවට නොපමුණුවනු මැනව."

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.